**වනසත්ව සංරක්ෂණ අරමුදල - 2017**

**------------------------------------------------------**

වනසත්ව සංරක්ෂණ අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 22 දරන වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත මඟින් සංශෝධිත වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 71(2)(ඌ) යටතේ නිකුත් කරනු ලබන නියෝග සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වනසත්ව සංරක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දක්වීම

---------------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 ඡේදය ප්‍රකාරව වත්කම් ක්ෂය කිරීම ආරම්භ කළ යුත්තේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙනආ පසුව වුවද ඊට පටහැනිව අරමුදල විසින් වත්කම අත්පත් කර ගත් වර්ෂයේ සම්පූර්ණයෙන් ක්ෂය කිරීමටත් ඉවත් කරන වර්ෂයේ ක්ෂය නොකිරීමටත් ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------------

ප්‍රධාන ගොඩනැගිලි පරිශ්‍රයෙහි ගල් ඇතිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැය කරන ලද රු.624,597 ක මුදල වියදමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

----------------------------------------

සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල වනසත්ව සංරක්ෂණ අරමුදලට ගෙවිය යුතු ලෙස රු.2,614,486 ක් දක්වා තිබුණද, අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය දැව සංස්ථාවෙන් ලැබුණු රු.512,751 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.2,101,735 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ගෙවිය යුතු ගිණුම්

------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 කට අධික කාලයක් ඉක්මවූ ගෙවිය යුතු සේවා ගාස්තු රු.5,908,269 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>--------------------------------- | |
| | (i) 5.2.4 ඡේදය | මුදල් වර්ෂය ආරම්භවීමට මාස 3 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අයවැය ලේඛනය අනුමත කළ යුතු වුවද, 2017 වර්ෂයේ අයවැය ලේඛනය අනුමත කර තිබුණේ 2017 ජනවාරි 17 දිනදීය. |
| | (ii) 8.2.2 ඡේදය | සමාලෝචිත වර්ෂය අවසානයට රු.693,399,171 ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණද, ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | 2013 අගෝස්තු 07 දිනැති අංක 4/2013 දරන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගිණුම් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.2,797,190 ක් වූ පරිත්‍යාග භාර ගැනීම, ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ අතිරික්තය රු. 1,546,489,131 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,168,164,618 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.378,324,513 ක වර්ධනයක් දක්නට ලැබුණි. උද්‍යාන පිවිසුම් ගාස්තු රු.324,724,976 කින් හා සේවා ගාස්තු රු.53,558,964 කින් වැඩි වීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.530,377,190 ක් වූ අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී 2017 වර්ෂයේ රු.1,546,489,131 ක් විය. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.594,139,340 ක් වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.1,664,801,571 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 අරමුදලට එරෙහිව හෝ අරමුදල විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල විසින් වනජීවී අපරාධ හා ජාතික උද්‍යානවල සිදු කරන ලද නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් බාහිර පුද්ගලයින්ට එරෙහිව එකතුව රු.31,862,000 ක වන්දි ඉල්ලා නඩු 702 ක් ගොනුකර තිබූ අතර ඉකුත් වර්ෂයේදී රු.29,846,000 ක වන්දි ඉල්ලා නඩු 601 ක් ගොනු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට අරමුදලට ලැබිය යුතු වන්දි මුදල රු.14,056,100 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 4.1 කාර්යසාධනය

--------------------

#### 4.1.1 සැලැසුම් කිරීම

----------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව අරමුදලේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා අදාළ කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි වර්ෂ 3 කට නොඅඩු කාලපරිච්ඡේදයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය

------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් ඉටු කර ගැනීම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ ව්‍යාපෘති 10 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.57,291,860 ක් වැය කර තිබූ අතර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘති 05 ක භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු විය.

(ආ) යන්ත්‍රෝපකරණ වාහන සහ බෝට්ටු මිලදී ගැනීම සඳහා රු.127,000,000 ක් හා ව්‍යාපෘති 33 ක් සඳහා රු.477,888,870 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද කිසිදු මිලදී ගැනීමක් සිදුකර නොතිබුණු අතර ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය තුළදී ජාතික වනෝද්‍යාන 26 කින් සතුන් නැරඹීම සඳහා නිකුත් කළ ප්‍රවේශ පත්‍රවලින් රු.2,235,036,136 ක ආදායමක් ලැබුවද වන සතුන් ආරක්ෂා කිරීම හා සුරක්ෂණය කිරීම කෙරෙහි දරා ඇති වියදම රු.68,388,992 ක් එනම් සියයට 3 ක් තරම් වූ අඩු ප්‍රතිශතයකි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------------

බෝට්ටුවක් මිලදී ගැනීම සඳහා 2017 මැයි 31 දින ශ්‍රී ලංකා නාවික හමුදාවට රු. 5,345,100 ක මුදලක් ගෙවීම් කළද, විගණිත දිනය වූ 2018 මැයි 09 දින වනවිටත් බෝට්ටුව ආයතනයට ලැබී නොතිබුණි.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ හේතු නිසා අනාථ වූ වන අලින් ප්‍රමුඛ අනිකුත් වනජීවීන් හා විවිධ රෝගාබාධයන්ට ලක් වූ වනජීවීන් සඳහා රැකවරණය සලසන උඩවලව ඇත් අතුරු සෙවනේ විගණිත දිනය වූ 2018 ජනවාරි 27 වනවිටත් වනජීවීන් සඳහා අත්‍යාවශ්‍ය ඖෂධ ගබඩාවේ නොතිබුණි. තවද කල් ඉකුත් වූ ඖෂධ වර්ග 17 ක රු.428,053 ක් වටිනා තොග ඒකක 4,004 ක් ගබඩාවේ පැවති අතර ඒවා වනජීවීන්ට ප්‍රතිකාර කිරීම සඳහා භාවිතා කර තිබුණි. කෙසේ වුවද, 2017 වර්ෂය තුල ඇත්අතුරු සෙවනේ ප්‍රතිකාර ලබන ලද වන සතුන් 240 කින් 98 දෙනෙකු මිය ගොස් තිබුණි. මෙම මියගිය වන ජීවීන් සම්බන්ධව පශ්චාත් මරණ පරීක්ෂණ නිගමන සටහන්ද සවිස්තර හා පැහැදිලිව නොවීය.

(ආ) මින්නේරිය හා උඩවලව ජාතික වනෝද්‍යානවලට අදාළව 2017 ජූලි හා ඔක්තෝබර් මාසවලදී සිදුකරන ලද විගණනයේදී 2016 හා 2017 වර්ෂවල ජාතික උද්‍යාන නැරඹීමට පැමිණි සංචාරකයින් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමට අදාළ ගේට්ටු පිටපත හා සරප් පිටපත පරීක්ෂා කිරීමේදී රු.1,894,597 ක මුදල් ඌනතාවයක් නිරීක්ෂණය විය. ඒ සම්බන්ධයෙන් ආයතනය විසින් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ) පුද්ගලික ආයතනයකින් පරිත්‍යාග ලෙස 2015 වර්ෂයේදී උඩවලව ඇත් අතුරු සෙවනට ලැබුණු රු.1,053,485 ක් වූ භාණ්ඩ බඩු වට්ටෝරු ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

## 4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

අරමුදලෙහි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩමේ නීත්‍යානුකූල අයිතිය අරමුදල වෙත ලබාගෙන නොතිබුණු අතර එම කාර්යාලයට නව කොටසක් ඉදි කිරීම සඳහා බදු රහිතව රු.6,322,500 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ අත්තිකාරම් වශයෙන් 2017 සැප්තැම්බර් 11 දින රු.1,264,500 ක් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2017 අගෝස්තු 18 දින වැඩ ආරම්භ කර 2018 පෙබරවාරි 18 දින වැඩ අවසන් කළ යුතුව තිබුණද 2018 මැයි 30 වනවිටත් ඉදිකිරීම් අවසන් කර නොතිබූ අතර භෞතික ප්‍රගතිය සියයට 15 ක් පමණක් විය.

## 4.5 වාහන උපයෝජනය

කිතුල්කොටේ අඩවි ආරක්ෂක කාර්යාලයට අයත් කැබ් රථයක් 2016 ඔක්තෝබර් 18 දින අනතුරට පත්වීමෙන් රු.124,000 කට ආසන්න දළ හානියක් සිදුවී ඇතත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. තවද අනතුර සිදුවී වර්ෂයක් ඉක්මවා තිබුණද අදාළ කැබ් රථය සඳහා අළුත්වැඩියාවන් සිදු නොකර කිතුල්කොටේ අඩවි කාර්යාල පරිශ්‍රයේ අනාරක්ෂිතව නවතා තිබුණි.

# 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත වනසත්ව සංරක්ෂණ අරමුදල විසින් සිය විෂය පථයට අනුව ළඟාකර ගත යුතු අරමුණු පහත පරිදි හඳුනාගෙන තිබුණි.

(i) තිරසර සංවර්ධනය පිණිස සාගර, මුහුදු හා සාගර සම්පත් සංරක්ෂණය හා ධරණීය භාවිතය.

(ii) භෞමික පාරිසරික පද්ධතීන් සුරක්ෂිත කිරීම. ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණය කිරීම සහ ජෛව විවිධතාව විනාශය නවතාලීම.

(iii) තිරසාර සංවර්ධනය සඳහා වන්නා වූ ගෝලීය සහ යෝජිත ක්‍රියාදාමය සවිමත් කිරීම හා පුනර්ජීවය.

(ආ) ඉහත (අ) පරිදි අරමුණු හඳුනාගෙන තිබුණද එම අරමුණු හා සම්බන්ධ වන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟාවිය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගැනීමට කටයුතුකර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය

-----------------------------

පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේද දුර්වල තත්ත්වයක පවතින බව අභ්‍යන්තර විගණන අංශය විසින් නිරීක්ෂණය කර තිබුණද ඒවා සවිබල ගැන්වීමට ප්‍රවේශයක් ආයතනය තුළ නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර අරමුදලේ කාර්යභාරය පුළුල්වීමට සාපේක්ෂව අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය බලගැන්වීමට කටයුතු කර නොතිබුණි. තවද වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහනෙහි ඇතුළත් කාර්යභාරයන් තුළ අරමුදලේ කාර්යසාධන විගණනයට ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

----------------------------------------------

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) අනුරාධපුර වනජීවී කලාපයේ නාම පුවරු ඉදිකිරීම හා විදුලිවැට නඩත්තු කිරීම වෙනුවෙන් අරමුදල විසින් සපයන අමුද්‍රව්‍ය යොදා ගනිමින් ඉදිකිරීම් කටයුතු නිමකිරීම සඳහා රු.1,876,440 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුම් 02 කට එළඹ තිබුණි. ආයතනය විසින් අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා නොතිබීම හේතුවෙන් හා ගිවිසුම්ගත මුදල අදාළ කාර්ය සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව අත්හැර තිබුණි.

### 6.3 අයවැය ලේඛනමය පාලනය

------------------------------------

අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 28 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

### 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මන්නාරම කාර්ය මණ්ඩල නිවාසය, අඩවි ආරක්ෂක කාර්යාලය හා කම්කරු නිල නිවාසය ඉදි කිරීම සඳහා 2011 වර්ෂයේ ගිවිසුමකට එළඹ රු.1,933,200 ක අත්තිකාරමක් ලබාදී තිබුණද ඉදිකිරීම් ආරම්භකර නොතිබුණි. අත්තිකාරම් ඇපකරය කල් ඉකුත්වීම හේතුවෙන් ගෙවන ලද අත්තිකාරම් මුදලද අය කර ගැනීමට නොහැකිවී තිබුණි. එසේ තිබියදී නැවත රු.9,931,179 ක නව සංශෝධිත මුදලකට පෙර කොන්ත්‍රාත්තුකරු වෙතම කාර්යය පවරා තිබුණද නීත්‍යානුකූල ගිවිසුමකට එළඹී නොතිබුණි. මේ අනුව රජයට රු.1,933,200 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) උඩවලව ඇත් අතුරු සෙවන නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින්ගෙන් ගාස්තු අයකර ගැනීම සඳහා යාන්ත්‍රික ක්‍රමවේදයකට ලදුපත් නිකුත් කිරීමට කටයුතු කර අදාළ කාර්යය පහසු කරගැනීමට අවධානය යොමුකර නොතිබුණු අතර අතින් ලියන ලද පොදු 172 කුවිතාන්සිය මඟින් ගාස්තු අය කිරීම සිදු කරන බව නිරීක්ෂණය විය.

(ඇ) 2012 වර්ෂයේදී රු.11,730,808 ක් වැය කර ඉදිකර තිබුණු විල්පත්තුව ජාතික උද්‍යානයේ පිහිටි කොල්ලන්කනත්ත (වීවල) සංචාරක බංගලාව ජල ගැටළු පැවතීම හේතුවෙන් භාවිතා නොකර නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

## 6.5 සමාජ වගකීම් ඉටු කිරීම

-------------------------------

උඩවලව ඇත් අතුරු සෙවන අලි පැටවුන් සඳහා කිරිපිටි මිලදී ගැනීම සඳහා වාර්ෂිකව කිරිපිටි පැකට් 68,985 ක් මිලදී ගැනීම හේතුවෙන් ඇසුරුම් කාඩ්බෝඩ්, නොදිරන කවර හා ප්ලාස්ටික් හැඳි වැනි දෑ ඇත් අතුරු සෙවන පරිශ්‍රයේ එකතුවීම සිදුවන අතර පරිසර හානිය වලක්වා ගත හැකි වන පරිදි එම අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ලිපි ලේඛන පවත්වාගෙන යාම. | පරිගණක ලේඛන, උප පත්‍රිකා පොත් ලේඛන සහ විස්තරාත්මක උප ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබීම. |
| (ආ) | තොග පාලනය. | ප්‍රාදේශීය කාර්යාලවල තොග ලේඛන නිසි පරිදි පවත්වා ගෙන ගොස් නොතිබීම. |
| (ඇ) | ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම | පරිගණකය මඟින් ප්‍රවේශ පත්‍ර නිකුත් නොකරන අවස්ථාවල අයථා මුදල් පරිහරණයට ඉඩ ප්‍රස්ථා තිබීම හා ලැබෙන මුදල්වල නිවැරදිතාවය ගැන සෑහීමට පත්විය නොහැකි වීම පිළිබඳව අවධානය යොමු කර නොතිබීම. |
| (ඈ) | අයවැය පාලනය. | අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් අතර විචලතාවන් පැවතීම. |
| (ඉ) | වාහන පාලනය | වාහන 13 ක රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම පින්තාරු කර නොතිබීම. |